# කුම්භ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයක භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයේ වැඩවසන සේක. එදා භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ කියා භික්ෂු සංඝයා අමතා වදාළා. ඒ භික්ෂූන් වහන්සේලා ද ‘පින්වතුන් වහන්ස’ යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. ඒ අවස්ථාවේ දී භාග්‍යවතුන් වහන්සේ මේ උතුම් දේශනය පවත්වා වදාළා.

“මහණෙනි යම් සේ කළයක් ආධාර (දරනු) රහිත ව තැබූ විට පහසුවෙන් පෙරළිය හැකි වන්නේ ද, ආධාර (දරනු) සහිත ව තැබූ විට පහසුවෙන් පෙරළිය නො හැකි වන්නේ ද, එසේ ම මහණෙනි සිත ආධාර රහිත වූ විට පහසුවෙන් පෙරළිය හැකි වෙයි. ආධාර සහිත වූ විට පහසුවෙන් පෙරළිය නො හැකි වෙයි.

මහණෙනි සිතට ආධාරය කුමක් ද? ඒ මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ම යි. එනම්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මෙය යි. මහණෙනි මෙය සිතට ආධාර යැ යි කියනු ලැබේ.

මහණෙනි යම් සේ කළයක් ආධාර රහිත ව තැබූ විට පහසුවෙන් පෙරළිය හැකි වන්නේ ද, ආධාර සහිත ව තැබූ විට පහසුවෙන් පෙරළිය නො හැකි වන්නේ ද, එසේ ම මහණෙනි, සිත ආධාර රහිත වූ විට පහසුවෙන් පෙරළිය හැකි වෙයි. ආධාර සහිත වූ විට පහසුවෙන් පෙරළිය නො හැකි වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මේ උතුම් දේශනය වදාළා. ඒ භික්ෂූන් වහන්සේලා ඉතා සතුටට පත් වුනා. භාග්‍යවතුන් වහන්සේ වදාළ මේ උතුම් දම් දෙසුම සාධුකාර නංවමින් සතුටින් පිළිගත්තා.

**සාදු ! සාදු !! සාදු !!!**



## DhammaMedicine

Namo Buddhaya !!!
This is the only path;
there is none other for
the purification of insight !

Visit this Google Group
Click2Comment | Discussions |



**Drink Dhamma medicine to get rid of all stresses**